සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

8161

## 7 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය

නම/විභාග අංකය :- ........................................................................................ කාලය : පැය 01 $\frac{1}{2}$ යි.

## I කොටස

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තෝරා හිස්තැන් පුරවන්න.**

(ගමප, රි ග ධ නි , ප̣ ස ස̇ , ගමප, සප, ම́නි)

1. ..................................... යන ස්වර කෝමල ස්වර ලෙස හඳුන්වයි.
2. ..................................... අචල ස්වර වේ.
3. බටහිර සංගීතයේ දී ..................................... යන ස්වර ආරෝහණයේ දී $F^{\#}$ හා $A^{\#}$ ලෙස හඳුන්වයි.
4. ..................................... යන ස්වර පිළිවෙළින් මන්ද්‍ර මධ්‍ය සහ උච්ච සප්තකයන්ට අයත් වේ.
5. සරිග, රිගම යන ස්වර රටාවේ ඊ ළඟට යෙදෙන ස්වර ඛණ්ඩය ..................................... වේ.

- **6 වැනි ප්‍රශ්නයේ සිට 10 වැනි ප්‍රශ්නය දක්වා දෙන ලද ප්‍රකාශ හරි නම් '✓' ලකුණත් වැරදි නම් '✕' ලෙසත් වරහන තුළ යොදන්න.**

6. සුවඳ පද්ම ඕළු ආදී යන ගීතය මාත්‍රා හතරෙන් හතරට ගයයි. ( )
7. විලම්බ, මධ්‍ය සහ ද්‍රැත යනු ලයෙහි ප්‍රභේද තුනය. ( )
8. බටහිර සංගීතයේ දී ♭ යන සලකුණ යොදනුයේ තීව්‍ර ස්වර හැඳින්වීම සඳහාය. ( )
9. වයලීන් පවුලේ භාණ්ඩ අතරින් පහළම නාද නිපදවන්නේ වයලීනයෙනි. ( )
10. ස්වර ස්ථාපන ගී ගායනය මඟින් ගායන හැකියාවන් වර්ධනය වේ. ( )

- **11 වැනි ප්‍රශ්නයේ සිට 20 වැනි ප්‍රශ්නය දක්වා නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

11. බටනළාවේ සියලුම සිදුරු විවෘත කර වාදනය කිරීමේ දී
 (1) ස ස්වරයේ නාදය නිකුත් වේ. (2) ප ස්වරයේ නාදය නිකුත් වේ.
 (3) ම́ ස්වරයේ නාදය නිකුත් වේ. (4) ශුද්ධ ම ස්වරයේ නාදය නිකුත් වේ.

12. වයලීනය අපරදිග ක්‍රමයට තත් සුසර කරනුයේ,
 (1) ප̣ ස ප ස̇ ලෙසය.
 (2) ම̣ ස ප රි̇ ලෙසය.
 (3) ප̣ ස ප රි̇ ලෙසය.
 (4) ප̣ රි ධ ග̇ ලෙසය.

13. ස්වර පුවරුවේ කලු යතුරුවලින් දැක්වෙන්න්,

(1) ශුද්ධ ස්වර වේ. (2) විකෘති ස්වර වේ.

(3) මන්ද්‍ර ස්වර වේ. (4) උච්ච ස්වර වේ.

14. "අතට වෙරළු ඇහිඳ ගෙනේ" .... මෙම ගීතය,

1) මව් ගුණ ගීතයකි. 2) පියගුණ ගීතයකි.

3) නැළවිලි ගීයකි. 4) තුන්සරණේ ගීතයකි.

15. "බෝ" එකකින් වාදනය කරන තත් හතරක් පමණක් තිබෙන සංගීත භාණ්ඩයකි.

1) එස්රාජය 2) දිල්රුබාව 3) වයලීනය 4) සිතාරය

16. කෝලම් රංග සම්ප්‍රදාය සඳහා භාවිත කළ අවනද්ධ වාදන භාණ්ඩය වනුයේ,

1) තබ්ලාව 2) ගැට බෙරය 3) පහතරට බෙරය 4) දවුල

17. " දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ" ගීතය,

1) අවග්‍රහයෙන් ගැයේ 2) සමග්‍රහයෙන් ගැයේ

3) විෂමග්‍රහයෙන් ගැයේ 4) දෘත ලයෙන් ගැයේ

18. තාලානුකූල රිද්මයකින් තොරව ගැයෙන ගීත,

1) අනාඝාතාත්මක ගීත වේ. 2) අඝාතාත්මක ගීත වේ.

3) නැළවිලි ගී වේ. 4) තුණ්සරණේ ගී වේ.

19. දූ ර | පෙ නෙ න | තැ නි ත | ලාS S | s + + |

ඉහත දැක්වෙන ගී පාදයේ ආඝාතය තැබීම ආරම්භ වන්නේ, ( තාල තැබීම ආරම්භ වන්නේ )

1) පළමු අක්ෂරය මතය. 2) දෙවන අක්ෂරය මතය.

3) තෙවන අක්ෂරය මතය. 4) හයවන අක්ෂරය මතය.

20. භක්තියෙන් ගයන ගීත විශේෂයකි.

1) නැළවිලි ගී 2) කෙළි ගී 3) තුන්සරණේ ගී 4) සරල ගී

## II කොටස

- **<ins>ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.</ins>**

1) (i) සප්තකයක් තුළ ඇති සම්පූර්ණ ස්වර ගණන ආරෝහණ ක්‍රමයට පිළිවෙළින් ලියන්න. (ලකුණු 5)

(ii) ස්වර පුවරුවක් ඇඳ එහි විකෘති ස්වර 5 අදාළ යතුරු උඩින් ලියන්න. (ලකුණු 5)

2) පහත සඳහන් ස්වර නම් කරන්න.

(i) ග̲̣ -

ම́̇ -

නි̲̣ -

ප̇ -

රි̲̇ -

(ලකුණු 1×5 = 5)

(ii) පහත දැක්වෙන බටහිර සංගීත ස්වර පෙරදිග සංගීත ක්‍රමවේදයට අනුව ලියන්න.

- ❖ $B^b$ -
- ❖ $C^\#$ -
- ❖ $A^b$ -
- ❖ $F^\#$ -
- ❖ G -

(ලකුණු 1×5 = 5)

3) (i) පහත දැක්වෙන ස්වර අභ්‍යාසය ආරෝහණ සහ අවරෝහණ ක්‍රමයට සම්පූර්ණ කරන්න.

ආරෝහණ - ග රි ස රි ග, ....................................

අවරෝහණ - ධ නි ස̇ නි ධ, .................................... (ලකුණු 5)

(iii) සවන පිනන ගීත මිහිර විඳිමු හද පුරා

ඉහත ගී පාදය ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 5)

4) (i) පහත සඳහන් ගීත ගායනයේ දී ආඝාතය යෙදෙන ක්‍රමවේදය අනුව අදාළ කොටුව තුළ '✓' යොදන්න.

| ගීත නාමාවලිය | සම ග්‍රහ | අව ග්‍රහ | විෂම ග්‍රහ |
|---|---|---|---|
| සසර වසන තුරු | | | |
| දිය ගොඩ සැම තැන | | | |
| දුර පෙනෙන තැනිතලා | | | |
| දන්නෝ බුදුන්ගේ | | | |
| හෙළ ජාතික අභිමානේ | | | |

(ලකුණු 5)

(ii) අ) ඔබ දන්නා උපදේශාත්මක ගීත තුනක මුල් පේළි ලියා දක්වන්න.

ආ) ඔබ ඉගෙන ගත් උපදේශාත්මක ගීතවල ඇතුළත් වූ ප්‍රස්තාව පිරුළු දෙකක් ලියන්න.

(ලකුණු 5)